| කොග්ගල බීච් හොටේල්, කොග්ගල ... | කොග්ගල බීච් හොටේල්ස් ලිමිටඩ්. |
| කැන්ඩි ටුවර් ඉන්ස්, මහනුවර... | ටුවරින්ස් ඕෆ් සිලෝන් ලිමිටඩ්. |
| ඔරියන්ට් පර්ල් හොටේල්, කටුනායක ... | ඔරියන්ට් පර්ල් හොටේල් ලිමිටඩ්. |
| රීජන්සි හොටේල්, නිලවැලි ... | රීජන්සි හොටේල්ස් ලිමිටඩ්. |
| සිලෝන් ඉන්ස්, වැල්ලවත්ත... | සිලෝන් ඉන්ස් ලිමිටඩ්. |
| එයාර්පෝර්ට් ඉන්ටර් නැෂනල්... හොටේල්, කටුනායක ... | එයාර්පෝර්ට් ඉන්ටර්නැෂනල් හොටේල් කොම්පැනි ලිමිටඩ්. |
| හොටේල් හොරයිසන්, කොග්ගල ... | රුහුණු හොටේල්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් ලිමිටඩ්. |
| හොටේල් වැලිගම රීෆ්, වැලිගම ... | වැලිගම රීෆ් හොටේල්ස් ලිමිටඩ් |
| හොටේල් හිමාලයා, මහනුවර ... | සන්ඩවුන්ස් ට්‍රැවල් සෙන්ටර් (සිලෝන්) ලිමිටඩ්. |
| දෙහිගම හොටේල්, මහනුවර ... | දෙහිගම හොටේල්ස් කොම්පැනි ලිමිටඩ්. |
| හොටේල් පිලිස්, ගල්කිස්ස ... | පිලිස් ලිමිටඩ්. |
| ෂැන්ග්රි-ලා හොටේල්, බම්බලපිටිය ... | සැන්ග්රි-ලා හොටේල්ස් ලිමිටඩ්. |
| බ්‍රවුන්ස් බීච් හොටේල්, මීගමුව ... | බ්‍රවුන්ස් ග්‍රෑප් මොටේල්ස් ලිමිටඩ්. |
| ගිරිතලේ හොටේල්, ගිරිතලේ ... | එකයිට් හොටේල්ස් ලිමිටඩ්. |

7-2/3 —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත**

**7අ වගන්තිය යටතේ දැන්වීම**

1972 අංක 17 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 7අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාර පතිරගේ මාටින් පෙරේරා වන මම, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි, සීමාසහිත සිලෝන් ටුබැකෝ කොම්පැනිය විසින් පවත්වාගෙන යනු ලබන හා මෙහි උපලේඛනයෙහි විස්තර කෙරෙන ව්‍යාපාරය එකී වගන්තියේ කාර්ය සඳහා අනුමත ව්‍යාපාරයක් බවට මෙම දැන්වීම මගින් ප්‍රකාශ කරමි.

1973 ජූනි 21 දා,
කොළඹ.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

**උපලේඛනය**

සමාගමේ 1932 මාර්තු දහනව වැනි දිනැති පරමාර්ථ සටහනෙහි නිශ්චිතව සඳහන් පරමාර්ථයන් ඉටුකරනු පිණිස වූ ව්‍යාපාරය.

**7-3** —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය**

1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 8(1) බී හා 8(1)ඩී දරණ ඡේදයන් යටතේ මුදල් ඇමතිතුමාට පැවරී ඇති බලතල යටතේ එතුමා විසින් පහත නම් සඳහන් අය මහජන බැංකුවේ අධ්‍යක්ෂවරුන් වශයෙන් පත් කොට ඇත:—

හෙක්ටර් අබේවර්ධන මහතා.

ඒ. ආර්. එම්. කලීල් මහතා.

එම්. එල්. විජේසේකර,
මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

1973 ජූනි 25 දින.

**7-206** —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**බන්ධනාගාර ආඥාපනත**

35(1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥා පනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන, මම, යාපනය බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, 1973 ජූලි මස 1 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා සී. පරමසිවම්පිල්ලේයි මහතා, සී. ජෙයරාජදේවන් මහතා, ඉසෙඩ්. සිංගරායර් මහතා සහ එස්. එස්. ප්‍රැන්සිස් මහතා මෙසින් පත් කරමි.

ෆීලි. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 ජූනි මස 22 වෙනි දින,
කොළඹ දී ය.

7-7/1 —73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

**බන්ධනාගාර ආඥාපනත**

35(1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥා පනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මීගමුව බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, 1973 ජූලි මස 1 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා ඩබ්ලිව්. වින්සන්ට් ප්‍රනාන්දු මහතා, ජේ. එස්. වින්සන්ට් ප්‍රනාන්දු මහතා, ෂෙල්ටන් එම්. ද සිල්වා මහතා සහ ඩබ්ලිව්. විල්ප්‍රඩ් ප්‍රනාන්දු මහතා මෙසින් පත් කරමි.

ෆීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 ජූනි මස 22 වෙනි දින,
කොළඹ දී ය.

**7-7/2** —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනත—28 (1) වගන්තිය යටතේ ආඥ**

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනතේ 28 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදේශීය හා දේශීය වෙළඳ ඇමති ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ පනවන ලදුව, 1972 පෙබරවාරි 8 වැනි දින අංක 14,996/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ආඥාවෙන් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා රජයේ වාණිජ (ඒකාබද්ධ අපනයන) නීතිගත සංස්ථාවේ කාර්යයන් සඳහා මෙහි වූ උපලේඛණයෙහි නිශ්චිතව සඳහන්, නිවේදිත නොවන, නිශ්චල දේපල යෝජිත පරිදි අත්කර ගැනීමේ යෝජනාව මේ ආඥාවෙන් අනුමත කරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1973 ජූනි මස 27 වැනි දින,
කොළඹදීය.

**උපලේඛනය**

ශ්‍රී ලංකා රජයේ වාණිජ (ඒකාබද්ධ අපනයන) නීතිගත සංස්ථාව විසින් දැනට පදිංචිව ඇත්තාවූද, කොළඹ නාගරික සභාවේ අංක 68 සහ 70 යන වරිපනම් අංක දරන්නාවූද පහත සඳහන් මායිම් වලින් යුක්තව කොළඹ, යෝර්ක් වීදියේ පිහිටා තිබෙන්නාවූද ගොඩනැගිලි, සවිකිරීම්, ඉඩම හා භූමි ප්‍රදේශය.

උතුරට: ඕස්ට්‍රේලියා ගොඩනැගිල්ල.
නැගෙනහිරට: කොළඹ යෝර්ක් වීදිය.
දකුණට: ඒ. ඒ. ලෝරන්ස් මහතාගේ (අංක 72 දරණ වරිපනම් අංකයෙන් යුතු) දේපල.
බටහිරට: ද මෙල් ගොඩනැගිල්ල.

7-176 —73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් සංවර්ධන ආඥා පනත (320 වැනි පරිච්ඡේදය)**

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 6(1) වැනි ඡේදය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ගරු ඇමති තුමා විසින් සා. ලි. සේ. I වැනි පංතියේ ලිපිකරු එස්. කන්දසාමි මහතා ඔහුගේ රාජකාරිවලට අතිරේකව වව්නියා දිස්ත්‍රික්කයේ ඉඩම් නිලධාරියෙකු වශයෙන් 1973. 04. 25 දින සිට පත්කර ඇත.

එස්. බී. සේනානායක,
අතිරේක ස්ථිර ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

1973. 5. 19.
කොළඹ,

7-30 —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**මිල පාලන පනත**

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක විසින් පනවනු ලැබ 1973 මැයි මස 11 වැනි දින අංක 59 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක. කේ/යු/76/73 දරණ ආහාර මිල නියෝගය (සාන්) විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973 ජූනි මස 13 වැනි දින අනුමත කරන ලද බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4(7) වැනි වගන්තිය යටතේ මෙසින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 ජූනි මස 13 වැනි දින,
කොළඹ දීය.

7-12 —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

### වී අලෙවි මණ්ඩලය

### හිමිකර ගැනීමේ දැන්වීම

1971 ක්වූ අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනතේ 33 වැනි ඡේදයේ (I) උප ඡේදයේ විධිවිධාන යටතේ කෘෂිකම් හා ඉඩම් කටයුතු භාර ගරු ඇමතිතුමන් විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ වී අලෙවි මණ්ඩලයේ නිලධාරියකු වන වර්ණකුලසූරිය වඩුමේස්ත්‍රිගේ ජිනදාස මෙන්ඩිස් වන මම එකී ඡේදයේ සඳහන් වර්ගයට හා විස්තරයට අදාළ දේපළක් වන මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපල වී අලෙවි මණ්ඩලයේ කාර්යයන් සඳහා අවශ්‍ය බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මෙන්ඩිස්,
සාමාන්‍යාධිකාරී, වී අලෙවි මණ්ඩලය.

1973 ක්වූ ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

නැගෙනහිර පලාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර්පත්තු ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් මූතූර් නම් ග්‍රාමයේ පිහිටි 1973 ක්වූ අප්‍රේල් මස 19 වෙනි දින හා 1973 ක්වූ අප්‍රේල් මස 26 වෙනි දින දරණ අවසර ලත් මිනුම්දෝරු නැන්පත් ජේ. එමානුවල් මහතා විසින් සැලසුම් කරන ලද නො. 18 දරණ පිඹුරෙහි පෙන්වා ඇති උතුරට: ටී. පී. 375086, රජයේ ඉඩම සහ මාවත; නැගෙනහිරට: මෙහි සඳහන් ඉඩමේ ලොට් නො. 3 දරණ කැබැල්ලද; දකුණට: මෙහි සඳහන් ඉඩමේ ලොට් නො. 3 සහ 2 දරණ කැබෙලිද; බස්නාහිරට: මඩකලපුවේ සිට ත්‍රිකුණාමලය දක්වා ඇති ප්‍රධාන පාරද යන මායිම් තුළ ප්‍රමාණයෙන් අක්කර 6 කුත් පර්චස් 3 ක් (අ. 6, රූ. 0, ප. 3) විශාල ඉල්ලුප්පයාඩිවෙනායි නැමති ඉඩමේ ලොට් නො. 1 දරණ ඉඩම් කැබැල්ල සම්පූර්ණ වශයෙන් සහ එහි පිහිටා ඇති සියළුම ගොඩනැගිලි, සවිකිරීම්, ඉදිකිරීම් සහ අතිකුත් දෑ සියල්ලම සම්පූර්ණ වශයෙන් සහ යන්ත්‍ර, මෝල්, උපකරණ සහ ඒ මත පිහිටි හෝ එහි ඇති මොනයම් ස්වභාවයක, වර්ගයක හෝ විස්තරයකට අදළ වෙනත් චංචල දේපළ සම්පූර්ණ වශයෙනි.

7-106/1 —73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

### 1971 අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනත

### 34 වෙනි වගන්තිය යටතේ ආඥාව

1971 අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනතේ 34 වෙනි ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකම් හා ඉඩම් අමාත්‍ය, හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම 1973 ක්වූ ජූනි මස 23 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි,

1. 1971 අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනතේ 33 වෙනි වගන්තිය යටතේ "නිවේදිත දේපළක්" වන්නාවූද, ඒ වගන්තිය යටතේ හිමිකර ගැනීම අත්හැරීමේ දැන්වීම කින් හිමිකම් අත්හරිනු නොලැබූද, මෙහි පහත උප ලේඛනයේ විස්තර කර ඇත්තාවූද සියළුම චංචල සහ නිශ්චල දේපළ, සහ
2. යම් නියම කර ගැනීමක, විධිමත් හෝ විධිමත් නොවූ එකඟ වීමක, බද්දක හෝ නොතාරිස් කෙනෙකු විසින් ලියා සහතික කරන ලද නීත්‍යානුකූල ලේඛනයක නියමයන් යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් ලැබී, 1973 ක්වූ ජූනි මස 20 වන දිනට වලංගු සියළු අයිතිවාසිකම්, සම්බන්ධතා හෝ අර්ථලාභ,

වී අලෙවි මණ්ඩලය සතු කරමි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකම් හා ඉඩම් අමාත්‍ය.

1973 ක්වූ ජූනි මස 22 දින,
කොළඹ දීය.

### ඉහත සඳහන් උපලේඛනය

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර්පත්තු ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් මූතූර් නම් ග්‍රාමයේ පිහිටි 1973 ක්වූ අප්‍රේල් මස 19 වෙනි දින හා 1973 ක්වූ අප්‍රේල් මස 26 වෙනි දින දරණ අවසර ලත් මිනුම්දෝරු නැන්පත් ජේ. එමානුවල් මහතා විසින් සැලසුම් කරන ලද නො. 18 දරණ පිඹුරෙහි පෙන්වා ඇති උතුරට: ටී. පී. 375086, රජයේ ඉඩම සහ මාවත; නැගෙනහිරට: මෙහි සඳහන් ඉඩමේ ලොට් නො. 3 දරණ කැබැල් ලද; දකුණට: මෙහි සඳහන් ඉඩමේ ලොට් නො. 3 සහ 2 දරණ කැබෙලිද; බස්නාහිරට: මඩකලපුවේ සිට ත්‍රිකුණාමලය දක්වා ඇති ප්‍රධාන පාරද යන මායිම් තුළ ප්‍රමාණයෙන් අක්කර 6 කුත් පර්චස් 3ක් (අ. 6, රූ. 0, ප. 3) විශාල ඉල්ලුප්පයාඩිවෙනායි නැමති ඉඩමේ ලොට් නො. 1 දරණ ඉඩම් කැබැල්ල සම්පූර්ණ වශයෙන් සහ එහි පිහිටා ඇති සියළුම ගොඩනැගිලි, සවිකිරීම්, ඉදිකිරීම් හා අතිකුත් දෑ සියල්ලම සම්පූර්ණ වශයෙන් සහ යන්ත්‍ර, මෝල්, උපකරණ සහ ඒ මත පිහිටි හෝ එහි ඇති මොනයම් ස්වභාවයක, වර්ගයක හෝ විස්තරයකට අදාල වෙනත් චංචල දේපළ සම්පූර්ණ වශයෙනි.

7-106/2—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතලප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම —

(අ) 1972 මාර්තු මස 24 වැනි දින අංක 15,003 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 2 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මොණරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටි සිත්තරම් පළාත ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

(1) තණමල්විල, අගුණකොළපැලැස්ස, "සහනය"හි පදිංචි විදානගමගේ සෙනෙවිරත්න මහතා.

(2) තණමල්විල, තණමල් විහාරයහි පදිංචි පූජ්‍ය මාවැල්ලේ නන්ද ස්ථවිර.

(3) තණමල්විල, නිකවැව, "ශාන්ති" හි පදිංචි සිරිපාල සූරියබණ්ඩාර මහතා.

(4) තණමල්විල, සූරියආර, මහවැව ජනපදය පදිංචි ඒකනායක දොන් අන්දිරිස් අප්පුහාමි මහතා.

(5) තණමල්විල, මීගස්වැව පදිංචි දොන් කොර්නේලිස් වීරසිංහ බස්නායක මහතා.

(6) තණමල්විල, තිස්ස පාර, අංක 23 හි පදිංචි දොන් පතිරණගේ සූරපාල මහතා.

(7) තණමල්විල, අළුත්ගොඩ පදිංචි කොඩිප්පිලි රණසිංහගේ ගුණසේන මහතා.

(8) තණමල්විල, බෝදාගම, "සිරිකුසුම" හි පදිංචි රම්පලගේ ගුණපාල සිරිවර්ධන මහතා.

(9) තණමල්විල, බෝදාගම පදිංචි සිරිවර්ධන රම්පලගේ දියෝනිස් අප්පුහාමි මහතා.

(10) හම්බේගමුව පදිංචි කරුණාදාස සූරියආරච්චි මහතා.

(11) තණමල්විල, නිකාර පදිංචි ඩී. ඇස්. ජයසේකර මහතා.

(12) තණමල්විල, කලවැල්ගල පදිංචි දොන් සාමෙල් ලියනාරච්චි මහතා.

(13) තණමල්විල, අගුණකොළපැලැස්ස පදිංචි විදානගමගේ විජේසිංහ මහතා.

(14) තණමල්විල, කලවැල්ගල පාත්‍රාගොඩ කංකානම්ගේ පියදාස මහතා.

(15) තණමල්විල, සූරියආර, මහවැව ජනපදය පදිංචි ආනන්ත පතිරගේ රණසිංහ මහතා.

(16) තණමල්විල, නිකාර පදිංචි මාදිරිස් ඇස්. දිසානායක මහතා.

(17) ඇඹිලිපිටිය, අබරත්තවෙල, හතරමංහන්දිය පදිංචි කඩ ගස්තානගේ ජිනදාස මහතා.

(18) ඇඹිලිපිටිය, හබරත්තවෙල පදිංචි නාමකන්ද දොන් විමලදාස රාජපක්ෂ මහතා.

(19) ඇඹිලිපිටිය, කිරිඉබ්බන් ආර, රේඩියෝ කඩේ බාරේ වික්‍රමාරච්චි අප්පුහාමිල්ලාගේ ජෝතන් සිංඤෝ මහතා.

(20) ඇඹිලිපිටිය, කිරිඉබ්බන් ආර පදිංචි ඊ. කේ. විජේබණ්ඩාර මහතා.

(21) ඇඹිලිපිටිය, කිරිඉබ්බන් ආර පදිංචි ඩී. ඒ. දහනායක මහතා.

(22) තුන්කම, මහගම ජනපද ග්‍රාම සංවර්ධන සමිතිය හි ජේ. ඒ. ප්‍රේමරත්න මහතා.

(23) අම්බලම්තොට, සූරියවැව පදිංචි ජේ. ඇම්. ගුණවර්ධන මහතා.

(24) තණමල්විල, තැපැල්හල හි පදිංචි ඒ. ඩබ්ලිව්. ඇම්. මහරූප් මහතා.

(25) තණමල්විල, කොමලිගම පදිංචි කේ. ජී. රාජපක්ෂ මහතා.

(26) තණමල්විල, සමගිපුර පුර කුමාරදාස වීරවික්‍රම මහතා.

(27) තණමල්විල, සමගිපුර පදිංචි ආර්. ටී. විජේරත්න මහතා.

(28) ඇඹිලිපිටිය, තුන්කම, මහගම බගිදරුව පදිංචි ඩී. ඊ. මුණසිංහ මහතා.

(29) ඇඹිලිපිටිය, හබරළුවැව ජනපදය, අංක 682 හි පදිංචි ඩී. ඇම්. පුංචිබණ්ඩා මහතා.

(30) ඇඹිලිපිටිය, හබරළුවැව පදිංචි ඩී. පී. දොඩම්ගොඩ මහතා.

(31) හම්බෙගමුව, අළුත්වැව පදිංචි යූ. ඇස්. ජිනපාල මහතා.

(32) හම්බෙගමුව, පදිංචි ආර්. ඇම්. අප්පුහාමි මහතා.

(ආ) තණමල්විල, අගුණකොළපැලැස්ස "සහනය" හි පදිංචි විදාන ගමගේ සෙනෙවිරත්න මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 ජූනි මස 22 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

7-53/1 —73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතලප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම —

(අ) 1972 මැයි මස 26 වැනි දින අංක 9 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 2 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මොනරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටි මොනරාගල සුළු නගර සහා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) මොණරාගල, හුලංදාව පදිංචි දිසානායක මුදියන්සේලාගේ පුංචිබණ්ඩා දිසානායක මහතා.

(2) මොණරාගල, ශ්‍රී තන්නංකර පිරිවෙනෙහි ශාස්ත්‍රාචාර්ය පූජ්‍ය බදුල්ලගම්මන රතනසාර ස්වාමීන් වහන්සේ.

(3) මොණරාගල ශ්‍රී තන්නන්කර පිරිවෙනෙහි පූජ්‍ය මාගන් දනමුල්ලේ ඉන්ද්‍රසුමන ස්වාමීන්වහන්සේ.

(4) මොණරාගල, මහවීදිය පදිංචි හපුහැන්නදිගේ නන්දසිරි මහතා.

(5) මොණරාගල, පින්නගොල්ල පදිංචි නෝර්බට් ඒකනායක මහතා.

(6) මොණරාගල, ගම්පහ බෙහෙත් ශාලාවෙහි සිරිදාස විජේ වික්‍රම මහතා.

(7) මෙණරාගල, වෙලේවත්ත පදිංචි රටේ රාලලාගේ ගුණ වර්ධන මහතා.

(8) මොණරාගල පදිංචි ඒකනායක වීලී ආරියපාල මහතා.

(9) මොණරාගල, අලකොලවගුර පදිංචි මහවිතාරනලාගේ කිරිබණ්ඩා මහතා.

(10) මොණරාගල, කොලොන්ගොල්ල පදිංචි රත්නායක මුදියන්සේලාගේ කරුණාරත්න මහතා.

(11) මොණරාගල, පින්නගොල්ල පදිංචි බෝකුරුගොඩ කංකානම්ගේ ආරියදාස මහතා.

(12) මොණරාගල, අලකොලවගුර පදිංචි පල්ලිහේවා ගීගනගේ ඇලෙක්සැන්ඩර් මහතා.

(13) මොණරාගල, සිරිගල පදිංචි ලන්දගේ පියසේම මහතා

(14) මොණරාගල, අබ්දුල් කයූම් සමාගම බාරේ නාඩිනා මොහම්මඩ් මොහම්මඩ් අමනුල්ලා මහතා

(15) මොණරාගල ධර්මදාස ගැරේජ්හි ඉමදුව වික්‍රමආචාරිගේ ධර්මදාස මහතා

(16) මොණරාගල පදිංචි සූරිය පටබැඳිගේ ජෝන්සිල්වා මහතා

(17) මොණරාගල, වැල්වාය පාර ඌව රේඩියෝ එන්ජිනියර්ස් හි කරුණානන්ද රාජපක්ෂ මහතා

(18) මොණරාගල, හුලංදුව පදිංචි ධර්මදාස වීරසේකර මහතා

(19) මොණරාගල පදිංචි මොහොමඩ් ෂෙරීප් හුසේන් මහතා

(20) මොණරාගල, සාමිමලේ වත්ත පදිංචි මුත්තයියා රාසු මහතා

(21) මොණරාගල, බෙරන්හාන පදිංචි ලීලා රංජනී මාලගොඩ පතිරණ මහත්මිය

(22) මොණරාගල, විහාරමුල්ල පදිංචි වන්නි ආරච්චිගේ ලීලාවතී පෙරේරා මහත්මිය

(23) මොණරාගල, දෙඩම්වත්ත පදිංචි රත්නායක මුදියන්සේලාගේ ප්‍රේමසේන මහතා

(24) මොණරාගල, පොතුවිල පාර අංක 179 යි පදිංචි හෙන්නායක මුදියන්සේලාගේ පුංචිබණ්ඩා මහතා

(25) මොණරාගල, නානායම අසල පදිංචි නයිදබදුගේ දවිත් සිංඤෝ මහතා

(26) මොණරාගල, හුලංදුව පදිංචි ධර්මදාස කොඩිතුවක්කු මහතා

(27) මොණරාගල නගරය පදිංචි දෙන් චාර්ල්ස් සමරසේකර වීරසූරිය මහතා

(28) මොණරාගල, සිරිගල පදිංචි කෝනාරමුදියන්සේලාගේ මුදලිහාමි මහතා

(29) මොණරාගල, වෙලේවත්ත පදිංචි රොබෝල්ගේ ජයතිස්ස ලෙනෝරා මහතා

(ආ) මොණරාගල, හුලංදුව පදිංචි දිසානායක මුදියන්සේලාගේ පුංචිබණ්ඩා දිසානායක මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 ජූනි මස 22 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

7-53/2 —73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

## සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම —

(අ) 1972 මැයි මස 26 වැනි දින අංක 9 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 9 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි අස්ගිරි උඩසියපත්තුව ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) මාතලේ වාලවෙල අස්ගිරි දොරකුඹුරේ, ගෙදරවෙල විහාරාධිපති පූජ්‍ය දොරකුඹුරේ ශ්‍රී ඉන්ද්‍රජෝති ස්වාමීන්වහන්සේ,
(2) මාතලේ, වාලවෙල, අලුත්ගම ශ්‍රී බෝධිමලු විහාරාධිපති පූජ්‍ය ඩබ්ලිව්. සුමනතිස්ස ස්වාමීන්වහන්සේ,
(3) මාතලේ, වාලවෙල, දූල්ලැව පදිංචි කුමාරසිංහ අත්තදස්සි දිවාකර මුදියන්සේලාගේ අප්පුහාමි කුමාරසිංහ මහතා,
(4) මාතලේ, වාලවෙල පදිංචි තුන්පත් ලියද්දේ වලව්වේ අබේසිංහ බණ්ඩා මහතා,
(5) මාතලේ, වාලවෙල, තුම්පත්ලියද්ද පදිංචි තුම්පත් ලියද්දේ දුග්ගන්නා වලව්වේ මුතුබණ්ඩා ඒකනායක මහතා,
(6) මාතලේ, වාලවෙල, දූල්ලැව පදිංචි දුනුතිලක මුදියන්සේලැ ජයතිලක බණ්ඩා මහතා,
(7) මාතලේ, වාලවෙල, අස්ගිරි දොරකුඹුර පදිංචි ඒකනායක මුදියන්සේලැගේ ජයතිලක බණ්ඩා මහතා,
(8) මාතලේ, වාලවෙල, අස්ගිරි දොරකුඹුර පදිංචි කෝරලේ ගෙදර පුංචි බණ්ඩා මහතා,
(9) මාතලේ, වාලවෙල, කැකුළැල්ල පදිංචි ගිනිලේවෙල පතිරන්නලාගේ හෙන්දිරික් අප්පුහාමි මහතා,
(10) මාතලේ, වාලවෙල, තල්ගහගොඩ පදිංචි හන්නස් මුදියන්සෙලංගෙදර අබේරත්න මහතා,
(11) මාතලේ, වාලවෙල, මාතලාපිටිය පදිංචි උඩුමුල්ලේ හෙට්ටිවානදේවගේ අමරසිංහ මහතා,
(12) මාතලේ, වාලවෙල, දලුවෙල පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ කරුණාරත්න මහතා,
(13) මාතලේ, වාලවෙල, අලුත්ගම පදිංචි කාරප්පේරු විජය තුංග රාජපක්ෂ මහමඩිගෙ මුදියන්සේරාලහාමිල්ලාගේ පුන්චිබණ්ඩා යටවත්ත මහතා,
(14) මාතලේ, වාලවෙල, අලුත්ගම පදිංචි රණවක ආරච්චිගේ දොන් රිචඩ් ද අල්විස් මහතා,
(15) මාතලේ, වාලවෙල, වෙල්පහල පදිංචි කොහොන වලව්වේ අබේරත්න බණ්ඩා උඩුගම මහතා,
(16) මාතලේ, වාලවෙල, අළුත්ගම පදිංචි තුන්පත් ලියද්දේ දුග්ගන්නා වලව්වේ ඇබිතිබණ්ඩා මහතා,
(17) මාතලේ, වාලවෙල දූල්ලැව පදිංචි වාසල මුදියන්සේලැ ඇස්වෙද ගෙදර රන්බණ්ඩා මහතා,
(18) මාතලේ, වාලවෙල, උණවේරුව පදිංචි දිවිල්ලේ බෝදාදුර ගෙදර හේමාවතී මහත්මිය,
(19) මාතලේ, වාලවෙල, උණවේරුව පදිංචි කිරාදුරයලැ ගෙදර ලොකුකිරියා මහතා,
(20) මාතලේ, වාලවෙල, ඇතිපොල පදිංචි මැදවලව්වේ පුංචි බණ්ඩා ඇතිපොල මහතා,
(21) මාතලේ, වාලවෙල, ඕවිටිපාන පදිංචි ඕවිටිපාන වලව්වේ මුතුබණ්ඩා මහතා,
(22) මාතලේ, වාලවෙල නාල්දෙන පදිංචි වෙදකාරගෙදර වී. ජී. උක්කුවා මහතා,
(23) මාතලේ, වාලවෙල. මාතලාපිටිය පදිංචි සෙට්ටිවාන දේවගේ නිමල් ප්‍රේමචන්ද්‍ර මහතා,
(24) මාතලේ, වාලවෙල, අළුත්ගම පදිංචි ලොකුබණ්ඩා රණසිංහ මහතා,
(25) මාතලේ, වාලවෙල, දූල්ලැව බෝධිරාජවිහාරවාසී පූජ්‍ය අඹන්පොල උපතිස්ස ස්වාමීන්වහන්සේ,
(26) මාතලේ, වාලවෙල, ඕවිටිපාන පදිංචි නවරත්න බණ්ඩා ඕවිටිපාන මහතා.

(ආ) මාතලේ, වාලවෙල, දූල්ලැව පදිංචි කුමාරසිංහ අත්තදස්සි දිවාකර මුදියන්සේලාගේ අප්පුහාමි කුමාරසිංහ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි සිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 ජූනි මස 22 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

7-53/3 — 73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකු වූ ඊ. එච්. දිසානායක මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥා පනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ වැඩබලන කම්කරු ඇමතිතුමන් විසින් දයා ද සිල්වා මහතා පත්කරන ලද බව වර්‍ෂ 1971 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. ඒ ගෝගලී මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 28 වැනි දින,
කොළඹ දීය.

7-208 — 73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

1973 මැයි මස 1 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ අසිස් සහ සිසිල් බීම නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් වශයෙන් පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ වැඩබලන කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1971 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලී මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 22 වැනි දින,
කොළඹ දීය.

නම නියමකොට පත්කරන ලද සාමාජිකවරු :—

1. මහාචාර්‍ය ඒ. බී. වී. ද එස්. ඉන්ද්‍රරත්න මහතා
2. වෛද්‍යාචාර්‍ය එච්. එච්. පියදස මහතා
3. කේ. ඇම්. ඇම්. බී. කරුණාරත්න මහතා

සේව්‍ය නියෝජිත සාමාජිකවරු :—

1. වී. ඩබ්ලිව්. එම්මානුවෙල් මහතා
2. ඊ. ඇස්. අප්පදොරේ මහතා
3. ජේ. බී. රාසයියා මහතා
4. වී. පී. විජේවීර මහතා
5. එච්. ඒ. අබේවර්ධන මහතා
6. ඇස්. සිවයෝගන් මහතා
7. බී. අයි. පියතිස්ස මහතා

සේවක නියෝජිත සාමාජිකවරු :—

1. ඇන්. ස්ටීවන් මහතා
2. ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා
3. ඇස්. තිරනාගම මහතා
4. ඇස්. සෙල්ලයියා මහතා
5. සමාදාන විනිශ්චයකාර ඊ. ඇම්. සොයිසා මහතා
6. ඇම්. සී. ඇම්. ෂාෆි මහතා
7. ඇස්. සිරිවර්ධන මහතා

7-125 — 73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

### මිල පාලන පනත

බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර හා විවිධ ද්‍රව්‍ය) මිල පාලක විසින් පනවනු ලැබූ. 1973 මාර්තු 16 වැනි දින අංක 51 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක බදු/දි/1/1973 දරණ ආහාර මිල ආඥාව (තිරිඟු පිටි) සහ අංක බදු/දි/2/1973 දරණ ආහාර මිල ආඥාව (පාන්) විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973. 6. 13 දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973, 6 මස 18 දින,
කොළඹ දීය.

7–113—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

දැනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වෙනි ශ්‍රේණියේ (අ) ඛණ්ඩයේ නිළධාරියෙකු වන දවුන්දගෙදර ඩික්සන් පොඩිසේකර මහතා, 1973 ජූනි මස 1 වෙනි දින සිට භාරකාර නිල ධාරියෙකු වශයෙන් කටයුතු කිරීමට මහා භාරකාර ආඥාපනත යටතේ ඇති 42අ රෙගුලාසිය අනුව මහා භාරකාර තැන විසින් පත් කර ඇති බවත්, එසේ කටයුතු කරන කාලය තුළදී මහා භාරකාර තැන වෙනුවට ලියකියවිලි, චෙච්පත් ආදියට අත්සන් කිරීමට ඔහුට බලය දී තිබෙන බවත්, මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරණු ලැබේ.

1970 මාර්තු මස 26 වෙනි දින අංක 14,899 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970.03.10 දින දරණ අංක 115 දරණ දැන්වීම මෙයින් අවලංගු කරණු ලැබේ.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 19 වෙනි දින,
කොළඹ 12.

7–25—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් අංක 11 හාමර් පාරේ කොළඹ 6 පදිංචි දේවරාහන්දි ක්‍රිෂ්ණමාලනී මංගලිකා මෙනෙවියට එම අධිකරණ කොට්ඨාශය ඇතුලත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ ජූනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

7–62 —73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංක: සී/අයි. 576.

### කාර්මික ආරවුල් පනත—131 වන පරිච්ඡේදය

1957 අංක 14 හා 62 සහ 1962 අංක 4 දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 1972 මැයි 16 වන දින දරන නියෝගයෙන් යොමු කරන ලදුව 1972 මැයි මස 26 වන දින අංක 9, දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද, කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතිය, 71 මැලේ වීදිය, කොළඹ 2. සහ මැකී ස්ටෝර්ස් හි හවුල් කරුවන් වන ඇල්. එම්. එම්. උවයිස් සහ එම්. යූ. එම්. රුෂ්ඩි මහතුන්, 265, කෙලින් වීදිය, කොළඹ 11 අතර පැවතුන කාර්මික ආරවුල පිළිබඳව බේරුම්කරුවා විසින් කම්කරු කොමසාරිස් තැන වෙත එවන්ට යෙදුනු තීරණය, ඉහත සඳහන් කරනලද පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් පළකරනු ලැබේ.

ජෝ. පී. ඊ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

1973 ජූනි මස 19 වැනි දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

සී. අයි. 576

ඒ. 1152

කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතිය,
71, මැලේ වීදිය,
කොළඹ 2.

සහ

මැකී ස්ටෝර්ස් හි හවුල්කරුවන් වන,
ඇල්. එම්. එම්. උවයිස් සහ එම්. යූ. එම්. රුෂ්ඩි මහතුන්,
265—කෙලින් වීදිය,
කොළඹ 11.

අතර පවත්නා කාර්මික ආරවුල පිළිබඳවයි.

#### තීරණය

ගරු කම්කරු ඇමතිතුමා විසින් කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ ඉහත සඳහන් ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා මා වෙත ඉදිරිපත් කොට ඇත. ආරවුලට හේතුවූ කාරණය වනුයේ කාර්මික හා සාමාන්‍ය කම්කරු සමිතියේ සාමාජිකයන් වන මැකී ස්ටෝර්ස් හී කර්මාන්ත අංශයෙහි සේවකයන් වෙනුවෙන් කර ඇති පහත දැක්වෙන ඉල්ලීම් යුක්ති සහගත ද, යන්නත්, ඔවුන්ට කුමණ සහනයන් හිමිද, යන්නත්, පිළිබඳව වේ. :—

(1) (අ) ඇඳුම් නිෂ්පාදන කර්මාන්තය සඳහා වන පඩි පාලක සභා තීරණ අනුව සේවකයන් වර්ගීකර පහළම ශ්‍රේණියට අවමය වශයෙන් රු. 180ක් පටන් ගන්නා වේතන පරිමානයක් ඇති කිරීම, දැන් පවත්නා වේතන ප්‍රමාණයන් අළුත් වේතන ප්‍රමාණයන්ට පරිවර්තනය කිරීමේ දී රු. 15 කින් වේතනය වැඩි කිරීම.

(ආ) ඉහත සඳහන් කරන ලද පඩි පාලක සභාවෙන් ආවරණය නොවන සේවකයන් සඳහා ද සමාන ක්‍රමයක් ඇති කිරීම.

(2) අවුරුද්දට එකතුව දින 42ක් වනතුරු නිවාඩු දින ගණන වැඩි කිරීම,

(3) මාස තුනක වේතනය ප්‍රසාද දීමනා වශයෙන් ගෙවීම,

(4) සමාගමේ නිෂ්පාදිත දේ කොටස් වශයෙන් ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීමේ වාසිය සැලසීම,

(5) සාධාරණ හේතුන් උඩ වැඩට පැමිණීම පමා වන සේවකයන්ට පරිමානානුකූලව වේතනය කපා හැරීමක් සහිතව වැඩෙහි යෙදවීම,

(6) අවමංගලාධාර ක්‍රමයක් ඇති කිරීම,

(7) අළුතෙන් සේවකයන් බඳවා ගැනීමේදී, දැනට සේවයේ යෙදී සිටින සේවකයන්ගේ ළඟ ඥාතීන්ට ප්‍රමුඛත්වය දීම,

(8) (අ) පඩි පතෙන් වෘත්තීය සමිති දායක මුදල් කෙළින්ම අඩු කර ගැනීම.

(ආ) කර්මාන්තශාලා භූමියෙහි වෘත්තීය සමිති කාර්යාලයක් ඇති කිරීම,

(ඇ) නිලධාරීන්ට වෘත්තීය සමිති මූලස්ථානය සමඟ කථා කිරීමට දුරකථන පහසුකම් සැලසීම,
(මෙම පහසුකම් පාලක පක්ෂය විසින් අහිමි කර ඇත.)

(ඈ) නම් සාමාජිකයන් වෙනුවෙන් ශාඛා සමිති නියෝජිතයන් විසින් කරනු ලබන නියෝජනයක් භාර ගැනීම.

මා ඉදිරිපිට ඇති සාක්ෂි අනුව මට පෙනී යන්නේ කම්කරු සමිතියෙනුත් පිළිගෙන තිබෙන කරුණක් නම් වැටුප් පාලක සභාවේ තීරණය අනුව පඩි ගෙවන බවයි. තවද, දිරි ගැන්වීමේ ක්‍රමය යටතේ සේවකයින් ඉල්ලා සිටින වැටුප් ප්‍රමාණය හෝ ඊට ඉතා කිට්ටු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි බව ද පෙනී යයි. තවද, බූරුකාති ගණකාධිකාරී සමාගම වෙනුවෙන් සාක්ෂි දුන් ගණකාධිකාරීවරයාගේ සාක්ෂිය අනුව කුඩ අංශය සහ කමිස අංශය වැඩි ලාභයක් නැති බවත්, පඩි වැඩි වුවහොත් පිටරට පටවන කුඩ සහ කමිසවල මිල වැඩිවීමට ඉඩ ඇති බවත්, මිළ වැඩි වුවහොත් තරඟකාරී මිලකට බඩු පිටරට දී විකිණීමට අපහසු වන බවයි. තවද, අද ලංකාවේ පවතින විදේශ විනිමය දුර්ලභතාවය ගැන කල්පනා කරන විට බොහෝ කර්මාන්ත හිමියන්ට කර්මාන්තශාලා පවත්වා ගෙන යෑමට අපහසු තත්වයක් ද ඇතිවී තිබේ. මේ කාරණා සියල්ල ගැන කල්පනා කරන විට සේවකයන් ඉල්ලා සිටි පඩි වැඩි කිරීම මම යෝජනා නොකරමි.

(1) (අ) ඉල්ලීම මම ප්‍රතික්ෂෙප කරමි.

(1) (ආ) මෙම ඉල්ලීම පඩි පාලක සභාව ඉදිරිපිට කළ යුතු එකක් බව මගේ හැඟීමයි. එබැවින් මෙම ඉල්ලීම ගැන දීමනාවක් මම කරන්නේ නැත.

(2) මා ඉදිරිපිට ඇති සාක්ෂි අනුව ද, කම්කරු සමිතියේ පිළිගැනීම අනුව ද පඩි පාලක සභාවේ තීරණය නිවාඩු දින අඩු වශයෙන් 14 ක් පමණි. දැනට මෙම ආයතනයේ සේවකයින්ට නිවාඩු දින 24 ක් ලැබේ. මෙය සෑහෙන බව මගේ හැඟීමය. එබැවින් මෙම ඉල්ලීම ද ප්‍රතික්ෂෙප කරන්නෙමි.

(3) ප්‍රසාද දීමනා ලාභය අනුව ස්වාමි පක්ෂය විසින් කළ යුතුව ඇති ගෙවීමක් යයි ස්වාමි පක්ෂයේ අධිනීතිඥ මහතා පවසයි. මේ කියමන මා පිළිගන්නෙමි. එබැවින් මේ ගැන ද දීමනාවක් කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැත. මේ ඉල්ලීම ද ප්‍රතික්ෂෙප කරන්නෙමි.

(4) උත්සව අත්තිකාරම්වලට අතිරේකව රු. 50 ක සමාගමේ බඩු මිලදී ගැනීමට සේවකයින්ට සලසා දෙන මෙන් සමාගමට නියම කරමි.

මෙම රු. 50 මාස 10 කින් කොටස් වශයෙන් ආපසු එකතු කරගන්නා මෙන් ද නියම කරමි.

(5) මා ඉදිරිපිට ඇති සාක්ෂි අනුව මට පෙනී යන්නේ එක සේවකයෙක් ප්‍රමාද වුවහොත් ඔහු සමඟ වැඩ කරන කණ්ඩායමේ අනිත් අයට නිකන් සිටීමට සිදුවන බවයි. ඔහුගේ ප්‍රමාදවීමට සෑහෙන වැටුපක් කපා හැරියත් මුළු කණ්ඩායමක්ම වැඩ නැතිව සිටින්නට වීම නිසා කපා හරින ලද වැටුප් කොටසට වඩා විශාල පාඩුවක් සමාගමට දැරීමට සිදුවනවා ඇත. තවද, සමාගමේ කළමනාකාර මොහමඩ් මහතාගේ සාක්ෂි අනුව සැළකිය යුතු කරුණක් නිසා ප්‍රමාද වුවහොත් මිනිත්තු 20ක කාලයක් ඔහුට ඉඩ දෙන බව ද, පෙනී යයි. එබැවින් මෙම ඉල්ලීම ද ප්‍රතික්ෂෙප කරමි.

(6) (7) මෙම ඉල්ලීම් කාර්මික ආරවුල් හැටියට මට පෙනී යන්නේ නැත. එබැවින් මෙම ඉල්ලීම ද මම ප්‍රතික්ෂෙප කරමි.

(8) (අ) ලිඛිත කැමැත්ත ප්‍රකාශ කර ඇති සේවකයින්ගෙන් වෘත්තීය සමිති දායක මුදල් පඩියෙන් කෙලින්ම අඩුකර ගැනීමට සමාගම විසින් ඉඩ දිය යුතු යයි මම නියෝග කරමි. මෙම ඉල්ලීමට මම ඉඩ දෙන්නෙමි.

(8) (ආ) මා ඉදිරිපිට ඇති සාක්ෂි අනුව කර්මාන්තශාලා භූමියෙහි සමිති කාර්යාලයක් ඇති කිරීමට ඉඩ නැති බව පෙනී යයි. එබැවින් මෙම ඉල්ලීම මම ප්‍රතික්ෂෙප කරමි.

(8) (ඇ) සුදුසු අවස්ථාවකදී වෘත්තීය සමිති නිලධාරීන්ට මූලස්ථානය සමඟ කථා කිරීමට දුරකථන පහසුකම් සැලසිය යුතු යයි මම යෝජනා කරමි. මෙයට සමාගම ඉඩ දිය යුතුයි.

(8) (ඈ) සමාගම වෙනුවෙන් ශාඛා සමිතියේ නියෝජිතයන් විසින් කරනු ලබන නියෝජනයන්ට ඇහුම්කන් දීම සමාගම විසින් කළ යුතුයි. මෙම ඉල්ලීමට ද මම ඉඩ දෙන්නෙමි.

ආනන්ද ජයසිංහ,
බේරුම්කරු.

1973 ක් වූ ජූනි මස 9 වැනි දින,
කොළඹ දී ය.

7–34—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සිඅයිර්/122/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩ බලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව, එක් පාර්ශවයක් වශයෙන්, පේරුදෙනියේ, හිඳගල, මහකන්ද වත්තේ, එම්. ඒ. එස්. රාමසුන්දරම් මහතා හා අනෙක් පාර්ශවය වශයෙන්, පේරාදෙනිය, හිඳගල, මහකන්ද වත්තේ, අයිතිකරු වන, කොළඹ 2, ස්ටේපල්ස් වීදියේ, යහල ගොඩනැගිල්ලේ, එච්. සී. පීරිස් මහතා, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

වැඩබලන කම්කරු ඇමති තැන්පත් දූල්වල ගලපිටගේ හේමචන්ද්‍ර සිරිසේන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිතවූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක 3 මහනුවර වෙත මෙයින් යොමුකරනු ලැබේ.

ඩී. ජී. එච්. සිරිසේන,
වැඩබලන කම්කරු ඇමති.

1973 ජූනි මස 19 දින
කොළඹදීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශ්වයක් වශයෙන්, පේරාදෙනිය, හිඳගල, මහකන්ද වත්තේ, එම්. ඒ. එස්. රාමසුන්දරම් මහතා හා අනෙක් පාර්ශවය වශයෙන්, පේරාදෙනිය, හිඳගල මහකන්ද වත්තේ අයිතිකරු වන, කොළඹ 2, ස්ටේපල්ස් වීදියේ, යහල ගොඩනැගිල්ලේ, එච්. සී. පීරිස් මහතා අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ පේරාදෙණිය, මහකන්ද වත්තේ පාලක පක්ෂය විසින් පේරාදෙනිය, මහකන්ද වත්තේ වතුපාලක, එම්. ඒ. එස්. රාමසුන්දරම් මහතාගේ වැටුප අඩුකිරීම සහ ඉන් අනතුරුව ඔහු සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

1973 ජූනි මස 19 වැනිදාවූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ජෝ. පී. ඊ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

7–13—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

අංක පී 7/1089.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් වෙළඳ හා කාර්මික ආයතන සේවක සංගමය, 213, ධර්මපාල මාවත, කොළඹ 7.

සහ

ඇම්. පී. ඇස්. මංචනායක මහතා අයිතිකරු, නවලංකා කොහුමෝල, පල්ලියපිටිය, දූනගහ අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද, වැඩබලන කම්කරු ඇමති තැන්පත් දූල්වල ගලපිටගේ හේමචන්ද්‍ර සිරිසේන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු, ගම්පහ ආනන්ද ජයසිංහ මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩී. ජී. එච්. සිරිසේන,
වැඩබලන කම්කරු ඇමති.

1973 ජූනි මස 22 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරාවුල් පනත**

ශ්‍රී ලංකා නිදහස් වෙළඳ හා කාර්මික ආයතන සේවක සංගමය, 213, ධර්මපාල මාවත, කොළඹ 7

සහ

ඇම්. පී. ඇස්. මංචනායක මහතා, අයිතිකරු, නවලංකා කොහුමෝල, පල්ලියපිටිය, දූනගහ අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණ නම්, දූනගහ, පල්ලියපිටියේ නවලංකා කොහුමෝලේ අයිතිකරු වන, ඇම්. පී. ඇස්. මංචනායක මහතා විසින්, කොළඹ 7, ධර්මපාල මාවතේ, 213 හි ශ්‍රී ලංකා නිදහස් වෙළඳ හා කාර්මික ආයතන සේවක සංගමයේ සාමාජිකයන් වන පහත සඳහන් සේවකයින් රක්ෂාවේ නොයෙදවීම යුක්ති සහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1. ජී. ඩී. රෝගුස්
2. ඩබ්. විලියොන්
3. ඩබ්. තේගිස්
4. ඩබ්. එමානිස්
5. ඩබ්. විජේපාල
6. ජී. රත්නායක
7. එච්. ජී. ඇට්මන්
8. ඩබ්. චාලන්
9. ඩබ්. ජේම්ස්
10. ඇස්. පී. තෝමස්
11. ඩබ්. බාලින්දුර
12. ඇල්. තිලකසිරි
13. ඩබ්. පියසේන
14. ඇන්. පියදාස
15. ආර්. ඩී. රේමන්
16. ඇම්. ජී. අමරසිංහ
17. ඩබ්. කේඩින්
18. ජී. ඇසිලින්
19. ඩබ්. මියුලින්
20. ආර්. පී. පොඩිනෝනා නොහොත් එමලින්
21. එච්. ජී. ඇල්පින්
22. ඇල්. ලිලිනෝනා
23. ජී. රොසලින්
24. ඇම්. විමලාවතී
25. ඒ. පී. ඇලා
26. ආර්. පී. සොයිදා
27. එච්. ඩබ්. වයලට් සේනානායක
28. ඇස්. පී. රොසලින්
29. එස්. පී. ලූසී
30. එස්. පී. ලූසි
31. ඩබ්. පී. සුසානා
32. එම්. ජී. සැල්පින්
33. ඩබ්. පොඩිනා

1973 ජූනි මස 12 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ජෝ. පී. ඊ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

7-166—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

# මිළ පාලන දැන්වීම්

**අංක ඇම්. ඇල් 1973/4 වන අංකය දරණ ආහාර මිළ නියෝගය**

මිළ පාලන පනත

පාන්

නියෝගය

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් සිරිල් ගමගේ වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වන වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1973.06.04 වන දින අංක 62/5 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක ඇම්.ඇල්. 1973/3 හා 1973.06.13 දරණ ආහාර මිළ නියෝගය මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වන සහ 3 වන තීරවල සඳහන් මිල ගණන් එම උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශවල, පිළිවෙලින් අවුන්ස 16 යේ හා අවුන්ස 8 වේ පාන් ගෙඩි මේ දැන් සිට විකිණිය හැකි වැඩිම මිළ බවත්, එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන් ගෙඩි නොවිකිණිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 16යේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත්,

(4) මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 වේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන්, එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත්,

(5) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දෙයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන්වලට ඇතුළත් බවත්,

(6) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් පැහැදිලිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත්,

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම පාන් විකුණන සෑම කෙනෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම්—

(අ) විකුණූ දිනය,
(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තර,
(ඇ) විකුණූ පාන් ප්‍රමාණය,
(ඈ) විකුණූ පාන්වලට ගෙවූ මුදල ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(8) තවද, ''අවුන්ස'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියම කරමි.

1973 ජූනි මස 22 වැනි දින පෙ.ව. 10.00ට මාතලේ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

සිරිල් ගමගේ,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) පාලක.

උපලේඛනය

| 1 වන තීරය | | 2 වන තීරය<br>අවුන්ස 8 කට වඩා බර පාන් සඳහා අදළ වැඩිම මිළ (අවුන්ස 16ක්)<br>රු. ශ. | | 3 වන තීරය<br>අවුන්ස 8 ක් හෝ ඊට අඩු පාන් සඳහා අදළ වැඩිම මිළ (අවුන්ස 8ක්)<br>රු. ශ. |
|---|---|---|---|---|
| (1) මාතලේ නගර සීමාව තුළ ... ... ... | ... | 0 48 | ... | 0 24½ |
| (2) මාතලේ නගර සභා කොට්ඨාශය හැර මාතලේ ප්‍රා. ආ. නි.කොට්ඨාශය, උකුවෙල ප්‍රා. උ. දි. කොට්ඨාශය, රත්තොට ප්‍රා. උ. දි කොට්ඨාශය, දඹුල්ල ප්‍රා. උ. දි. කොට්ඨාශය, ගලේවෙල ප්‍රා. ආ.නි. කොට්ඨාශය, ලග්ගල උඩසිය පත්තුව හා ලග්ගල පල්ලේසිය පත්තුව හැර ලග්ගල ප්‍රා. ආ. නි. කොට්ඨාශය හා නාඋල ප්‍රා. උ. දි. කොට්ඨාශය | ... | 0 49 | ... | 0 25 |
| (3) ලග්ගල උඩසිය පත්තුව, ලග්ගල පල්ලේසිය පත්තුව... ... | ... | 0 50 | ... | 0 25½ |

7–36–73.06. වැනි දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

කේ.ඩී,/149 දරණ ආහාර මිළ නියෝගය — තිරිඟු පිටි

මිළ පාලන පනත

නියෝගය

(173 වන අධිකාරය)වන මිළ පාලන පනතේ 4 වන වගන්තිය සමග කියවෙන 3(2) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල අනුව මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ සහකාර මිල පාලක (ආහාර) තැන්පත් මුතු බණ්ඩාර රණසිංහ වන මම, මෙම නියෝගය මගින් පහත සඳහන් නියමයන් කරමි. :—

(1) අංක 61 සහ 1973 මැයි මස 25 වෙනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද අංක කේඩී/147 සහ 1973 අප්‍රේල් මස 18 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

(2) තවද, මීට යාකොට ඇති පළමුවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් පෙදෙස් තුළ තිරුඟු පිටි තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බරෙන් රාත්තල් 148ක් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ 2 වෙනි තීරයේ අනු පිළිවෙලින් සඳහන් කරතිබෙන මිළ ගණන් බව වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් නියෝග කරමි.

(3) තවද, මීට යාකොට ඇති දෙවැනි උපලේඛනයෙහි සඳහන් පෙදෙස් තුල තිරිඟුපිටි සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ දෙවැනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළගණන් බව වහාම බල පැවැත්වෙන පරිදි මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්‍යයන් සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමද, ශුද්ධ බර හොන්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකවර විකිණීමද තොග වෙළඳාමක් ලෙස සලකණු ලැබේ.

(ආ) තිරිඟු පිටි ශුද්ධ බරින් හොණ්ඩරයකට වඩා අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වෙළඳමක් ලෙස සළකනු ලැබේ.

(ඇ) ඉරිඟු මිශ්‍ර තිරිඟු පිටි ද , තිරිඟු පිටි වශයෙන් සලකනු ලැබේ.

(5) එසේම මෙම මිළ නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ කිසියම් ප්‍රදේශයක තිරිඟු පිටි ඉරිඟු පිටි සමහ හැර වෙනයම් කිසි ද්‍රව්‍යයක් සමහ මිශ්‍ර කොට නොවිකිණිය යුතු බව මෙයින් නියම කරමි.

(6) එසේම කිසිවකු විසින් තිරිඟු පිටි ප්‍රමාණයෙන් සියයට 10 කට වඩා ඉරිඟු පිටි සමහ මිශ්‍ර කර නොවිකිණිය යුතු බව මෙයින් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙ න් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ තමාගේ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම එම තිරිඟු පිටි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ පිටිවලට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට අඩුනොවූ ඉලක්කම් විලින් මිළ පුවරුවක ලියා, එම පුවරුව භාජනයක ඇද, එම පිටිද, මිළ පුවරුවද , ඕනෑම ගනුදෙනුකරුවෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියෝග කරමි.

(8) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල'' හෝ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද මෙයින් නියම කරමි.

(9) එසේම මෙම නියෝගයේ කාර්‍යය ශුද්ධ බර රාත්තල් 148කට අඩුවෙන් හෝ වැඩි ප්‍රමාණයක තිරිඟු පිටි තොග වශයෙන් විකුණන්නේ නම් ඒ සඳහා නියමිත මිළ මෙම නියෝගයෙන් නියමිත රාත්තල් 148ක් සඳහා වූ තොග මිළෙන් සමානුපාතිකව ගණන් ගත යුතුය.

(10) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තොග වශයෙන් තිරිඟු පිටි විකුණන සෑම තැනැත්තකු විසින් සෑම අවස්ථාවකම හා සිල්ලර වශයෙන් තිරිඟු පිටි විකුණන සෑම තැනැත්තකු විසින් මිලයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් —

(අ) විකුණූ දිනය,
(ආ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුවයි),
(ඇ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන්ද, යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද මෙයින් නියම කරමි.

(11) තිරිඟු පිටි විකිණීමේදී එය යම්කිසි දෙයක බහාලනු ලැබුවේනම් හෝ ඔතනු ලැබුවේනම් එහි මිලත් මෙම නියෝගයෙන් නියමිත මිළ ගණන්වලට ඇතුළත් වන බව මෙයින් නියම කරමි.

1973 ජූනි මස 19 වෙනි දින පූ.භා. 9ට මහනුවර කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඈම්. බී. රණසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ
උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාශයේ
සහකාර මිළ පාලක (ආහාර).

## පළමුවෙනි උපලේඛනය

| පළමුවෙනි තීරය<br>පෙදෙස | දෙවෙනි තීරය<br>තිරිඟු පිටි<br>ශුද්ධ බර රාත්තල් 148 ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| 1. මහනුවර නාගරික ප්‍රදේශය ... ... ... ... ... | 71 50 |
| 2. උඩුනුවර ප්‍රා.ආ.නි. කොටස— | |
| ගෙලිඔය ... ... ... ... ... ... | 71 40 |
| දව්ලගල ... ... ... ... ... ... | 71 40 |
| වට්ටප්පොල ... ... ... ... ... ... | 71 40 |
| 3. යටිනුවර ප්‍රාදේශීය උප දිසාපති කොටස— | |
| කඩුගන්නාව ... ... ... ... ... ... | 71 34 |
| පිළිමතලාව ... ... ... ... ... ... | 71 34 |
| 4. පහතහේවාහැට ප්‍රාදේශීය උප දිසාපති කොටස — | |
| තලාතු ඔය ... ... ... ... ... | 71 74 |
| මාරස්සන ... ... ... ... ... ... | 71 74 |
| දෙල්තොට ... ... ... ... ... ... | 71 94 |
| 5. පාතදුම්බර ප්‍රා.ආ.නි. කොටස— | |
| නවයාලතැන්න ... ... ... ... ... ... | 71 55 |
| වත්තේගම ... ... ... ... ... | 71 55 |
| කුන්ඩසාලේ ... ... ... ... ... | 71 55 |
| 6. මැදදුම්බර ප්‍රා.ආ.නි. කොටස— | |
| තෙල්දෙනිය ... ... ... ... ... ... | 71 66 |
| උඩිස්පත්තුව ... ... ... ... ... ... | 71 66 |
| 7. උඩදුම්බර ප්‍රා.ආ.නි. කොටස— | |
| මාඩුගොඩ ... ... ... ... ... ... | 71 96 |
| 8. මිනිපේ ප්‍රා.ආ.නි. කොටස— | |
| හසලක ... ... ... ... ... ... | 72 34 |
| මොරයාය ... ... ... ... ... | 72 34 |
| 9. හාරිස්පත්තුව ප්‍රා.ආ.නි. කොටස— | |
| අලවතුගොඩ ... ... ... ... ... ... | 71 63 |
| තිත්තපජ්ජල ... ... ... ... ... ... | 71 58 |
| පූජාපිටිය ... ... ... ... ... ... | 71 55 |
| හැදෙනිය ... ... ... ... ... ... | 71 58 |
| 10. තුම්පනේ ප්‍රා.ආ.නි. කොටස— | |
| ගලගෙදර ... ... ... ... ... ... | 71 84 |
| හතරලියද්ද ... ... ... ... ... ... | 71 84 |
| 11. උඩපළාත ප්‍රා.ආ.නි. කොටස— | |
| කුරුඳුවත්ත ... ... ... ... ... ... | 71 55 |
| ගම්පොල ... ... ... ... ... ... | 71 55 |
| නාරන්විට ... ... ... ... ... ... | 71 55 |
| දූල්පිටිය ... ... ... ... ... ... | 71 55 |
| උලපනේ ... ... ... ... ... ... | 71 55 |
| 12. පස්බාගෙ කෝරළේ ප්‍රා.ආ.නි. කොටස— ... ... ... ... | |
| නාවලපිටිය ... ... ... ... ... ... | 71 55 |

| පළමුවෙනි තීරය<br>පෙදෙස | දෙවෙනි තීරය<br>තිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 148ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල |
|---|---|
| | රු. ශ. |
| 13. අඹගමු කෝරළේ ප්‍රා.ආ.නි. කොටස— | |
| හැටන් ... ... ... ... ... ... | 71 55 |
| මස්කෙලිය ... ... ... ... ... ... | 71 79 |
| කෙහෙල්ගමුව ... ... ... ... ... ... | 71 63 |
| 14. නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රා.ආ.නි. කොටස— | |
| හඟුරන්කෙත ... ... ... ... ... ... | 71 88 |
| රිකිල්ලගස්කඩ ... ... ... ... ... ... | 71 88 |
| පදියපැලැල්ල ... ... ... ... ... ... | 72 03 |

දෙවැනි උපලේඛනය

| පළමුවෙනි තීරය<br>පෙදෙස | දෙවෙනි තීරය<br>තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණිය හැකි ශුද්ධ බර රාත්තලක වැඩිම මිල<br>රු. ශ. |
|---|---|
| 1. (අ) මහනුවර නාගරික ප්‍රදේශය<br>(ආ) ගඟවට කෝරළය<br>(ඇ) උඩුනුවර ප්‍රා.ආ.නි. කොටස<br>(ඈ) යටිනුවර ප්‍රා.උ. දිසාපති කොටස<br>(ඉ) දෙල්තොට, පට්ටියගම, උඩගම, පට්ටියගම, පල්ලේගම, ගබඩාගම, නවනැලිය, බෝපිටිය, ගුරුදෙනිය, පුලියද්ද, මයිලපිටිය, මාරස්සන, උඩුවෙල, පල්ලේගම සහ උඩුවෙල-උඩගම යන ග්‍රාමසේවක කොට්ඨාශ හැර පාතහේවාහැට ප්‍රා.උ. දිසාපති කොටසේ අනිකුත් සියලුම ප්‍රදේශ<br>(ඊ) පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය<br>(උ) මැදදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශය<br>(ඌ) හාරිස්පත්තුව ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය<br>(එ) උඩපළාත ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය<br>(ඒ) පස්බාගේ කෝරළේ ප්‍රා.ආ.නි. කොට්ඨාශය ... | 0 49½ |
| 2. (අ) දෙල්තොටපට්ටියගම, උඩගම, පට්ටියගම, පල්ලේගම, ගබඩාගම, නවනැලිය, බෝපිටිය, ගුරුදෙනිය, පුලියද්ද, මයිලපිටිය, මාරස්සන, උඩුවෙල-පල්ලේගම සහ උඩුවෙල-උඩගම යන පාතහේවාහැට ප්‍රා.උ. දිසාපති තැනගේ ග්‍රාමසේවක කොට්ඨාශ<br>(ආ) තුම්පනේ ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය<br>(ඇ) උඩත්තව සහ මීමුරේ යන ග්‍රාමසේවක කොට්ඨාශ හැර උඩදුම්බර ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශයේ අනිකුත් සියලුම ගම් ප්‍රදේශ<br>(ඈ) පොල්පිටිය ග්‍රාමසේවක කොට්ඨාශය හැර අඹගමුව කෝරළයේ ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ අනිකුත් ප්‍රදේශ<br>(ඉ) ඉඩම්පිටිය ග්‍රාමසේවක කොට්ඨාශය හැර නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ අනිකුත් සියලුම ප්‍රදේශ ... | 0 50 |
| 3. අඹගමුව කෝරළයේ ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ පොල්පිටිය ග්‍රාමසේවක කොට්ඨාශය ... ... | 0 51½ |
| 4. (අ) උඩත්තව හා මීමුරේ යන උඩදුම්බර ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ<br>(ආ) ඉඩම්පිටිය යන නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ... | 0 51½ |

**සැළකිය යුතුයි.**—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියම මිළ නොවේ. මෙවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැක.

7–129/1—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

**කේඩී/148 වෙනි අංකය දරණ මිළ පාලන නියෝගය** **පාන්**

**මිල පාලන පනත**

නියෝගය

(173 වැනි අධිකාරය) මිළ පාලන පනතේ 4 වෙනි වගන්තිය සමග කියැවෙන 3(2) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල අනුව මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ සහකාර මිළපාලක (ආහාර) තැන්පත් මුතුබණ්ඩාර රණසිංහ වන මම මෙම නියෝගය මගින් පහත සඳහන් නියමයන් කරමි :—

(1) අංක 61 සහ 1973 මැයි මස 25 වැනි සිකුරාද දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත මටයින් නිකුත් කරන ලද අංක කේඩී 146 සහ 1973 අප්‍රේල් මස 18 වැනි දින දරණ ආහාර මිළ නියෝගය වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ දෙවෙනි සහ තුන්වැනි තීරුවල සඳහන් මිළ එම උපලේඛනයේ පළවැනි තීරයේ සඳහන් ප්‍රදේශවල පිළිවෙලින් අවුන්ස 16 සහ 8 පාන් ගෙඩි, විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවත්, එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන් ගෙඩි නොවිකිණිය යුතු බවත්, වහාම බලපැවැත්වෙන පරිදි මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8කට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8කට වඩා බර කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත්,

(4) මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 ප්‍රමාණයකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8කට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත්,

(5) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දෙයක් වේනොත් එහි මිළක් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන්වලට ඇතුළත් බවත්,

(6) මෙම මිළ නියෝගයෙන් වැඩිය මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දෙක් මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සඳහන් කරන ලද දැන්වීමක් පැහැදිලිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත්,

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම පාන් විකුණන සෑම කෙනෙකුම මිළයට ගන්නා අය ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;

(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තර;

(ඇ) විකුණූ පාන් ප්‍රමාණය;

(ඈ) විකුණූ පාන්වලට ගෙවූ මුදල ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(8) තවද, " අවුන්ස " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමයට අනුව සම්මත අවුන්සයේ බර බවද නියම කරමි.

1973 ජූනි මස 19 වැනි දින, පෙරවරු 9 ට මහනුවර කච්චේරියේ දී අත්සන් කරන ලදි.

එම්. බී. රණසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ
උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ
සහකාර මිළ පාලක (ආහාර).

උපලේඛනය

| පළමුවැනි තීරය | දෙවන තීරය<br>අවුන්ස 16කට බර ඇති පාන් ගෙඩියක් විකිණිය හැකි වැඩිම මිළ | | තුන්වන තීරය<br>අවුන්ස 8ක් බර ඇති පාන් ගෙඩියක් විකිණිය හැකි වැඩිම මිළ | |
|---|---|---|---|---|
| | | රු. ශ. | | රු. ශ. |
| 1. මහනුවර නාගරික ප්‍රදේශය ... ... ... | අවුන්ස 16ක් බර ඇති පාන් ගෙඩියක් | 0 48 ... | අවුන්ස 8ක් බර ඇති පාන් ගෙඩියක් | 0 24 |
| 2. මහනුවර නාගරික ප්‍රදේශය හැර නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ හා සෙසු සියලුම ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයන් තුළ | අවුන්ස 16ක් බර ඇති පාන් ගෙඩියක් | 0 49 ... | අවුන්ස 8ක් බර ඇති පාන් ගෙඩියක් | 0 25 |

සැළකිය යුතුයි.—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියම මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැක.

7–129/2—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

මිළ පාලන පනත

මිළ පාලන නියෝග අංක 119

1973 ජූනි මස 14 වැනි දින අංක 64 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවූ අංක 119 දරණ මිළ පාලන නියෝගය මා විසින් අත්සන් කරන ලද දිනය පහත සඳහන් පරිදි සංශෝධනය වියයුතු බව මෙයින් නිවේදනය කරමි.

" 1973 ජූනි මස 04 වැනි දින පෙ. ව. 8 ට හම්බන්තොටදී අත්සන් කරන ලදී ".

ආර්. ජෝසප්,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

7-213 —73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියා පදිංචි කිරීම

විවාහ ලියා පදිංචි කිරීමේ ආඥාපණතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ආහුල් හමීඩ් මොහොමඩ් සුබෙර් ෆාරූක් නැමති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 1003 ... | 25.6.1973 ... | මීසමේ ශාලාව ... | මාදෙල පනාවල් කෝරලේ කෑගල්ල දිස්ත්‍රික්කය | ගරු එච්. ඩී. පෝල් දේවගැති | ලංකා පැන්තකෝස්ත මීසම |

මොහොමඩ් ෆාරූක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්‍යාලය,
කොළඹ, 1973 ජූනි 25.

7-111—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

වන්දනා ගමන් ආඥාපනත

වෙල්ලස්ස-කොටබෝව දේවාලයේ ඇසළ උත්සවය—1973

යථෝක්ත උත්සවය 1973 ජූලි මස 28 වැනි දින ආරම්භවී 1973 අගෝස්තු මස 13 වැනි දින දක්වා පැවැත්වෙන බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1964. 07. 24 දින අංක 14,117 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පතේ සඳහන් රෙගුලාසි කෙරෙහි මහජයාගේ විශේෂ අවධානය මෙයින් යොමු කරවමි.

එස්. ජේ. සුමනසේකර බණ්ඩා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජූනි මස 23 වැනි දින,
මොණරාගල දිසාපති කාර්‍යාලයේ දීය.

7-47—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශිය උප දිසාපති කොට්ඨාශයේ ගවයින් නිවරණය කිරීම—1973 වර්ෂය

1962.08.20 වෙනි දින අංක 13,268 සහ 1962.11.29 දින අංක 13,406 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රවල ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 89 දරණ සත්ව පනතේ 35 වෙනි වගන්තිය ප්‍රකාර පනවන ලද 12(iii) වෙනි රෙගුලාසි අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රදේශය උප දිසාපති කොට්ඨාශයේ ගවයින් නිවරණය කිරිම පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දිනවල සහ ස්ථානවලදී සිදු කරනු ලබන බැව් මහජනයා වෙත මෙයින් දන්වනු ලැබේ.

ඩී. එච්. ජේ. අබේගුණසේකර,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජුනි මස 23 වෙනි දින,
හම්බන්තොට කච්චේරියේ දීය.

උපලේඛනය

| ග්‍රා. සේ. අංකය | ග්‍රාම සේවක කොට්ඨාශය | නිවරණ කරන ස්ථානය | නිවරණය කරන දිනය |
|---|---|---|---|
| 458 | කොටුවෙගොඩ | මුස්ලිම් වීදියේ කොටුවෙ වැව ලඟ | 1973.08.01 |
| | | වීරකැටියට හැරෙන හන්දිය ලඟ | 1973.08.02 |
| | | තහන්චි වැව ලඟ | 1973.08.03 |
| 460 | වල්ගම්එලිය | ග්‍රා. සේ. කාර්යාලය පිහිටි ඉඩම | 1973.08.01 |
| | | ඇස්. ජී. ලුවිස් සිංඤෝ මහතාගේ ගෙය පිහිටි ඉඩම | 1973.08.02 |
| | | පලතුඩුව මාතෘ නිවාසය පිහිටි ඉඩම | 1973.08.03 |
| 462 | මාරකොල්ලිය | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973 08.01 |
| | | ගොඩිගමුව පුංචි වැව අසල | 1973.08.02 |
| 463 | රැකව | රැකව සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.01 |
| | | රැකව ග්‍රා. සේ. කාර්යාලය අසල | 1973.08.02 |
| | | ඔරුවැල්ලට හැරෙන හන්දිය අසල | 1973.08.03 |
| 464 | නැ. නාකුලුගමුව | නැ. නාකුලුගමුව ග්‍රා.සේ. කාර්යාලය පිහිටි ඉඩම | 1973.08.01 |
| 465 | බ. නාකුලුගමුව | බ. නාකුලුගමුව ග්‍රා.සේ. කාර්යාලය අසල | 1973.08.01 |
| | | බ. නාකුලුගමුව සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.02 |
| 466 ඒ | නැ. කුඩාවැල්ල | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | කන්දෙවත්ත | 1973.08.02 |
| | | ධීවර සංස්ථා භූමිය අසල | 1973.08.03 |
| 466 බී | බ. කුඩාවැල්ල | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 467 | මාවැල්ල | මාවැල්ල සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.01 |
| 468 | සීනිමෝදර | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 469 | උනාකුරුව | උනාකුරුව වැව ලඟ | 1973.08.01 |
| | | ගොඩවැල්ල වෙල හන්දිය | 1973.08.02 |
| | | ග්‍රාම සේවක කාර්යාලය | 1973.08.03 |
| | | කොරිය හන්දිය අසල | 1973.08.04 |
| 470 | කදුරුපොකුණ | නැ. කදුරුපොකුණ සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.01 |
| | | බ. කදුරුපොකුණ සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.02 |
| 471 | ගලගම | ගලගම ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 472 | බෙලිඅත්ත | බෙලිඅත්ත ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 474 | දෙද්දුවාවල | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 475 | පලපොත | මාරාවෙහේනෙ කඩේ ලඟ | 1973.08.01 |
| | | අඹගහමුල කඩේ ලඟ | 1973.08.02 |
| | | බැබිලදෙණිය කඩේ ලඟ | 1973.08.03 |
| 476 | කුඩාහීල්ල | යෝධ ඇල ආරාමය අසල | 1973.08.01 |
| 477 | කහවත්ත | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | අරන්වෙල හන්දිය අසල | 1973.08.02 |
| 478 | පුවක්දන්ඩාව | බෙලිඅත්ත ගම් සභා කාර්යාලය අසල | 1973.08.01 |
| | | අලිගරුප්පෙ කඩේ අසල | 1973.08.02 |
| | | හම්බාර දෙණිය අසල | 1973.08.03 |
| | | වළං සමුපකාරය අසල | 1973.08.04 |
| 479 | සිට්නමලුව | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 480 | පොලොම්මාරුව | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | ඉරිකොදුවෙල වතුර වැඩපල අසල | 1973.08.02 |
| 481 | මහහීල්ල | ග්‍රාම සේවක කාර්යාල අසල | 1973.08.01 |
| 481 ඒ | අම්බල | ග්‍රාම සේවක කාර්යාලය ඉදිරිපිට ඉඩම | 1973.08.01 |
| 482 | තාරපේරිය | ග්‍රාම සේවක කාර්යාල අසල | 1973.08.01 |
| | | තාරපේරිය රජයේ පාසල අසල | 1973.08.02 |
| 483 | ගොඩවෙල | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | ගොඩවෙල ගම ගෙදර නම් ඉඩම | 1973.08.02 |
| | | පානමුල්ල කඩපිල අසල | 1973.08.03 |
| 484 | වහරක්ගොඩ | ග්‍රාමසේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | ළිඳ අමුන ගොඩ | 1973.08.02 |
| 485 | දම්මුල්ල | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 485 ඒ | පට්ටියවෙල | පට්ටියවෙල සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.01 |
| | | නිහිලුව සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.02 |

| ග්‍රා. සේ. අංකය | ග්‍රාම සේවක කොට්ඨාශය | නිවරණය කරන ස්ථානය | නිවරණය කරන දිනය |
|---|---|---|---|
| 486 | පල්ලත්තර | පල්ලත්තර සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.01 |
| | | ඉපිටවත්ත නැමැති ඉඩම | 1973.08.02 |
| | | නුගේවෙල බෝගස අසල | 1973.08.03 |
| | | මුරුංගස්වත්ත නැමැති ඉඩම | 1973.08.04 |
| 487 | උතුරු ගැටමාන්න | ග්‍රාම සේවක කාර්යාල අසල | 1973.08.01 |
| 487 ඒ | දකුණු ගැටමාන්න | තැන්නපල්ල කඩේ අසල | 1973.08.01 |
| | | ග්‍රාමසේවක කාර්යාලය අසල | 1973.08.02 |
| | | බණ්ඩාර වත්ත කඩපළ අසල | 1973.08.03 |
| | | ඇල්දෙණිය ගංගාව වත්ත ගෙදර ඉඩම | 1973.08.04 |
| 488 | පහල බෙලිගල්ල | අහුල්මඩුව සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.01 |
| | | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.02 |
| 489 | ඉහළ බෙලිගල්ල | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 491 | තේනගම | තේනගම ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| 492 | වගේගොඩ | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | හිටපු ගම්මුලාදෑනි මහතාගේ ඉඩම | 1973.08.02 |
| | | වහරක්ගොඩ ගෙදර කඩය අසල | 1973.08.03 |
| 493 | සියඹලාගොඩ | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | වාසල අසල කුඹියවල නැමැති ඉඩම | 1973.08.02 |
| | | අරන්වෙල රජයේ පාසැල අසල | 1973.08.03 |
| 543 | නෙටොල්පිටිය | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | මැදගම සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.02 |
| | | වැලිආර පැගිරි බොයිලරය අසල | 1973.08.03 |
| | | ජී. දෙන් මර්තේනිස් පදිංචි ඉඩම | 1973.08.04 |
| 544 | පට්ටියපොල | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | මහවැවේ ජූල්ගහවත්ත නැමැති ඉඩම | 1973.08.02 |
| | | ගොන්කටුආරේ විගමුවෙ ගෙදර | 1973.08.03 |
| | | අමුකනත්තවෙල පොල් ඉඩම | 1973.08.04 |
| 545 | විතාරන්දෙණිය | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | රොටේ හන්දිය අසල | 1973.08.02 |
| | | විතාරන්දෙණිය මීගහවල ගෙදර ඉඩම | 1973.08.03 |
| 546 | විගමුව | තලන්න සංචාරක බෙහෙත් ශාලාව අසල | 1973.08.01 |
| | | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.02 |
| | | කේ. බී. අර්නෝලිස් නැමැති අයගේ ඉඩම | 1973.08.03 |
| | | කි. ග. දෙන් හෙන්ද්‍රික්ගේ ගාල අසල | 1973.08.04 |
| 548 | ගුරුපොකුණ | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.01 |
| | | තිල්ලවටවන වැව අසල | 1973.08.02 |
| 549 | කහදමෝදර | කහදමෝදර සමුපකාර ප්‍රාදේශිකය අසල | 1973.08.01 |
| | | උණපදුරවත්ත අසල | 1973.08.02 |
| 552 | රන්න | රන්න මාර්කට් භූමිය | 1973.08.01 |
| | | කට්ටකඩුව වැව අසල | 1973.08.02 |
| | | වාඩියගොඩ පාසැල අසල | 1973.08.03 |
| | | කෝගස්ගොඩ වැව අසල | 1973.08.04 |

7-51—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

**පොලොන්නරුව දිස්ත්‍රික්කයේ 1973 වර්ෂයේ ගවයින් හණ නිවරණය කිරීමේ වැඩ සටහන**

ඇලහැර ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශය

1962 නොවැම්බර් මස 27 වැනි දින 13,406 (සිංහලෙන්) දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හණ නිවරණය කිරීම පිළිබඳ නීති මාලාවේ 12 (iii) වගන්තිය අනුව පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ඇලහැර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ 1973 වර්ෂයට ගවයින් හණ නිවරණය කිරීමේ වැඩ සටහන මහජනයාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරනු ලැබේ. (පෝය දිනවල නිවරණය කරනු නොලැබේ.)

අමරදාස ගුණවර්ධන,
පොලොන්නරුව දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජූනි 18 වැනිද,
පොලොන්නරුව දිසාපති කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| ග්‍රාම සේවක කොටස නම සහ අංකය | ගම | නිවරණය කරන ස්ථානය | නිවරණය කරන දිනයන් |
|---|---|---|---|
| 70ඒ—කෝද්දුරුවාව | කෝද්දුරුවාවපරනගම | කෝද්දුරුවාව තරුණ ගොවිපල අසල | 1973 ජූලි 16 |
| | ට්‍රැක් 33 | කෝද්දුරුවාව විදුහල අසල | 1973 ජූලි 17 |
| | දියබෙදුම | දියබෙදුම රජයේ බෙහෙත් ශාලාව අසල | 1973 ජූලි 18 |
| | ඉහකුළුවැව | රජයේ විදුහල අසල | 1973 ජූලි 19,20 |
| | ට්‍රැක් 35 | අංක 3 ඉඩම | 1973 ජූලි 21 |
| | ට්‍රැක් 46 | අංක 138 ඉඩම | 1973 ජූලි 23, 24 |
| | ට්‍රැක් 42 | ජී. ඊ. ජී. සයිමන් මහතාගේ ඉඩම | 1973 ජූලි 25 |
| 70බී—අත්තනකඩවල | ට්‍රැක් 23 | ජයලත් බේකරිය අසල | 1973 ජූලි 26 |
| | ට්‍රැක් 26 | ගුණරත්න මුදලාලිගේ කඩේ අසල | 1973 ජූලි 27 |
| | ට්‍රැක් 29 | ග්‍රාමසේවක කාර්යාලය අසල | 1973 ජූලි 28, 30 |

| ග්‍රාම සේවක කොටස නම සහ අංකය | ගම | නිවරණය කරන ස්ථානය | නිවරණය කරන දිනය |
|---|---|---|---|
| 70බී—කෝට්ටපිටිය ... | වැක් 8 ... | ... අංක 9 ඉඩම ... ... | ... 1973 ජුලි 31 |
| | වැක් 14 ... | ... අළුත් වී ගබඩාව අසල ... ... | ... 1973 අගෝස්තු 01 |
| | වැක් 18 ... | ... අංක 5 කඩේ අසල ... ... | ... 1973 අගෝස්තු 02 |
| | වැක් 19 ... | ... අළුත් වී ගබඩාව අසල ... ... | ... 1973 අගෝස්තු 03, 04 |
| 70සී—ඇලහැර ... | අතරගල්ලෑව | ... සමුපකාරය අසල ... ... | ... 1973 අගෝස්තු 06 |
| | ඇලහැර | ... කරඳගොල්ල පරණ වී ගබඩාව අසල ... | ... 1973 අගෝස්තු 07 |
| | සියඹලාව | ... සමුපකාරය අසල ... ... | ... 1973 අගෝස්තු 08 |
| | බකමූන ... | ... ග්‍රාමසේවක කාර්යාලය අසල ... | ... 1973 අගෝස්තු 09, 10 |

7–35—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

සමුපකාර සමිති ආඥාපනත (124 වැනි අධිකාරය)

### සමුපකාර සමිති වසාදැමීමේ කටයුතු අවසන්කිරීම

පහත සඳහන් සමුපකාර සමිති ඒ එක එක සමිතියේ නම ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයෙහි වසා දමන ලද බව සමුපකාර සමිති පිළිබඳ ආඥාපනතේ 52 (2) වැනි වගන්තිය අනුව මෙයින් දනුම් දෙනු ලැබේ.

| | සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|---|
| 1. | සීමාසහිත වහාතෝරි ගබොල් සාදන්නන්ගේ සමුපකාර සමිතිය | ... 73. 04 01 |
| 2. | සීමාරහිත නාවලකන්ද ණය දෙන සමුපකාර සමිතිය | ... 73.04.02 |
| 3. | සීමාසහිත ආඩිඅම්බලම පලාත "බී" කොටසේ ගොවිද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවිකිරීමේ සමුපකාර සමිතිය | 73.04.02 |
| 4. | සී/ස. පමුණුගම සමුපකාර කඩ සමිතිය ... | ... 73.04.02 |
| 5. | සී./ර. එරුවිල් ණය දෙන සමුපකාර සමිතිය | ... 73.04 02 |
| 6. | සී/ස. පෙරුන්කාලි පත්තු සිගරට් දුම්කොළ වවන්නන්ගේ සමුපකාර සමිතිය ... ... | ... 73.04.02 |
| 7. | සී/ස. මාන්මුණෙයි දකුණු බස්නාහිර ණය දෙන සමුපකාර සමිති සංගමය ... ... | ... 73.04.02 |
| 8. | සී/ස අරුණ කාන්තා රෙදි වියන්නන්ගේ සමුපකාර සමිතිය | 73.04.02 |
| 9. | සී/ස. හබරාදූව සමුපකාර කඩ සමිතිය ... | ... 73.04.02 |
| 10. | සී/ස. කරුක්කායිතිව් ශ්‍රී කන්දවේල් ණය දෙන සමුපකාර සමිතිය ... ... | ... 73.04.03 |
| 11. | සී/ර. නුන්ගමුගොඩ සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... | ... 73.04.03 |
| 12 | සී/ස. මහලේගොඩ සමුපකාර කඩ සමිතිය | ... 73.04.03 |
| 13. | සී/ර. මිල්ලගහගොඩ සමුපකාර ණය දෙන සමිතිය | ... 73.04.03 |
| 14. | සී/ර. හොරකන්වල සමුපකාර ණය දෙන සමිතිය | ... 73.04.03 |
| 15. | සී/ස. ස්ටැනිස්ලාවතු සමුපකාර කඩ සමිතිය | ... 73.04.04 |
| 16. | සී./ර. හතරබාගේ සමුපකාර ණය දෙන සමිතිය | ... 73.04.05 |
| 17 | සී/ස. මොහොරිය ගාමිණි තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... | ... 73.04.05 |
| 18. | සී/ස. ඌරුමුක්ත සමුපකාර කඩ සමිතිය ... | ... 73.04.06 |
| 19. | සී/ස. කොටගේපිටිය සමුපකාර කඩ සමිතිය | ... 73.04.06 |
| 20. | සී/ස. තලයාඩි සමුපකාර ධීවර සමිතිය ... | ... 73.04.06 |
| 21. | සී/ස. පන්ඩිරිප්පු ඩිවිෂන් 2 සමුපකාර කඩ සමිතිය | ... 73.04.06 |
| 22. | සී/ස. කට්ටාන්කුඩි ඩිවිෂන් 6 පැදුරුවියන්නන්ගේ සමුපකාර සමිතිය ... ... | ... 73.04.09 |
| 23. | සී/ස. නව දගලබටුවන්හේන සමුපකාර කඩ සමිතිය | ... 73.04.10 |
| 24. | සී/ර. නයාපාමුල සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... ... | ... 73.04.11 |
| 25. | සී/ස. ගල්වෙහෙර සමුපකාර කඩ සමිතිය | ... 73.04.11 |
| 26. | සී/ස. උඩමන්ගල ගොවිද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවිකිරීමේ සමුපකාර සමිතිය ... ... | ... 73.04.12 |
| 27. | සී/ස. ඉහල බෙලිගල්ල සමුපකාර කඩ සමිතිය | ... 73.04.12 |
| 28. | සී/ස. ඉහල බෙලිගල්ල විවිධ සේවා සමුපකාර සමිතිය | ... 73.04.12 |
| 29. | සී/ස. වවුනාවතු (තෙල්පල්ලයි නැගෙනහිර) සමුපකාර කඩ සමිතිය ... | ... 73.04.23 |
| 30. | සී/ස. මාන්මුනෙයි උතුරු නැගෙනහිර එළවළු ඇතිකරන්නන්ගේ සමුපකාර සමිතිය ... | ... 73.04 23 |
| 31. | සී/ස. සාන්ත ජෝශප් වඩුකාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | 73.04.23 |
| 32. | සී/ස. වෙඩ්ඩිපලායම් සමුපකාර කඩ සමිතිය | ... 73.04.23 |
| 33. | සී/ස. වාලයිචේනයි එළවළු ඇති කරන්නන්ගේ සමුපකාර සමිතිය ... ... | ... 73.04.23 |
| 34. | සී/ස. කහඹිලියාගොඩ මැටි කර්මාන්ත සමුපකාර සමිතිය | ... 73.04.23 |
| 35. | සී/ස. මල්මඩුව කුළුහණ සමුපකාර සමිතිය | ... 73.04.24 |
| 36. | සී/ස. කුඹුක්වෙල විවිධ සේවා සමුපකාර සමිතිය | ... 73.04.24 |
| 37. | සී/ස පොහොරබාව සමුපකාර කඩ සමිතිය | ... 73.04.25 |
| 38. | සී/ස. කිරුලපන නැගෙනහිර සමුපකාර කඩ සමිතිය | ... 73.04.25 |
| 39. | සී/ස. අම්බලන්තොට සමුපකාර වී වෙළඳසැල් සමිතිය | 73.04.26 |
| 40. | සී/ර.ගොරදෙරවව සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... ... | ... 73.04 28 |

ආර්. බී. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

1973 ජූනි මස 13 වැනි දින,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
ආදිපාද වීදිය,
කොළඹ–1.

7–85—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## 1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන පනත)

### සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

පහත සඳහන් සමිති එම සමිති නම් ඉදිරියේ සඳහන් කර ඇති දින දී වසා දමන ලද බව 1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ (2) වෙනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|---|
| 1. | සී./ස. ශාන්ත මරියා තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... | 73. 04. 06 |
| 2. | සී./ස. තෙන්නකුරියාව තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... | 73. 04. 06 |
| 3. | සී/ස. සමන්තුරෙයි ඩිවිසන් 3 සමුපකාර කඩ සමිතිය ... | 73. 04. 06 |
| 4. | සී./ස. අඹවල සමුපකාර කඩ සමිතිය ... | 73. 04. 06 |
| 5. | සී./ස. බොන්දුපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය | 73. 04. 10 |
| 6. | සී./ස. පරෙයිගම ගොවීතැන් කිරීමේ හා ගොවි ද්‍රව්‍ය අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... | 73. 04. 10 |
| 7. | සී./ස. දෙහිදෙනිය මුරුතලාව විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 73. 04. 11 |
| 8. | සී./ස. ලේවැල්ල තල්වත්ත විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 73. 04. 28 |
| 9. | සී./ස. කොහොවිල විවිධ සේවා සමුපකාර සමිතිය | 73. 04. 28 |

ආර්. බී. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

1973 ජූනි මස 13 දින,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 419,
කොළඹ 1.

7-86—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

අංක 442

**1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධි විධාන) පනත 2 (1) වැනි වගන්තිය යටතේ ආඥාව**

1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 2 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්, රාජගුරු බණ්ඩාර රාජගුරු වන මම, මෙහි වූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ('' ඒකාබද්ධ වන සමිති '' යනුවෙන් හැඳින්වෙන) සමිති මෙහි වූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ('' ප්‍රධාන සමිතිය '' යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමග 1973 ජූලි 10 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්.

1973 ජුනි 22 දින,
කොළඹ 1,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

**පළමුවෙනි උපලේඛනය**

ඒකාබද්ධ වන සමිති :

| සමිතියේ නම | ලි.ප. අංකය | | ලි.ප. කළ දිනය |
|---|---|---|---|
| සීමාසහිත කයිකාඩි ශ්‍රී මහා විශ්නු සමුපකාර ධීවර සමිතිය | ජේ/1092 | ... | 1951.06.11 |

**දෙවෙනි උපලේඛනය**

ප්‍රධාන සමිතිය

| සමිතියේ නම | ලි.ප. අංකය | | ලි.පං කළ දිනය |
|---|---|---|---|
| සීමාසහිත වාවාකච්චේරි ධීවර කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | ය/1589 | ... | 1972.03.01 |

7–109—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශොධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවක් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශන යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

12. **1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. **1968.12.1** දින සිට සංශෝධිත දායක ගාස්තු*

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 50 | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 30 | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 60 | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන **ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළු දෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

1973

| මාසය | පලකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... 73.06.29 | සිකුරාද | දවල් 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... 73.07.06 | සිකුරාද | දවල් 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... 73.07.13 | සිකුරාද | දවල් 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... 73.07.20 | සිකුරාද | දවල් 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... 73.07.27 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... 73.08.03 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... 73.08.10 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... 73.08.17 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... 73.08.24 | සිකුරාද | දවල් 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... 73.08.31 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... 73.09.07 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... 73.09.14 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... 73.09.21 | සිකුරාද | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.